**මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛතා මාර්ග - 1 කොටස ව්‍යාපෘතිය 2016**

-----------------------------------------------------------------------

මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛතා මාර්ග - 1 කොටස ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ චීන සංවර්ධන බැංකු සංස්ථාව අතර 2010 දෙසැම්බර් 16 දින එළඹි අංක 4500402212010110492 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල්, යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහා මාර්ග හා නාවික කටයුතු අමාත්‍යාංශයද, වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, වැදගත් සේවාවන් හා ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් දායක වීමට එමඟින් ප්‍රවේශ පහසුකම් සැපයීමත් රට පුරා ව්‍යාප්තව ඇති ප්‍රමුඛතා පදනම මත තෝරාගත් මාර්ග කොටස් පුනරුත්ථාපනය කිරීම හරහා රටේ ජාතික මාර්ග ජාලයේ සංචලතාවය වැඩි දියුණු කිරීමයි. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇ.එ.ජ.ඩොලර් මිලියන 169.80 කට සමාන රු.මිලියන 18,864 ක් වන අතර එයින් ඇ.එ.ජ.ඩොලර් මිලියන 152.80 කට සමාන රු.මිලියන 16,976 චීන සහයෝගීතා බැංකුව විසින් සැපයීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 දෙසැම්බර් 29 දින ආරම්භ කළ අතර 2013 දෙසැම්බර් 29 දින අවසන් කිරීමට නියමිතව පැවතුණි. කෙසේනමුත්, ව්‍යාපෘතියේ කටයුතු 2014 ජූලි 15 දින අවසන් කර තිබුණි.කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු 2017 දෙසැම්බර් 31 දක්වා සිදුකර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතිවලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කරන ලද විගණන මතය සඳහා පදනම**

---------------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් පැන නඟින බලපෑම් මත ඇතිවන ගැලපීම් හැරුණු කොට මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම්වල දක්වා අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි. ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුල සහ 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2016 වර්ෂය තුල | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | ඇ.එ.ජ. ඩොලර් මිලියන | රු. මිලියන | රු. මිලියන | ඇ.එ.ජ. ඩොලර් මිලියන | රු. මිලියන | ඇ.එ.ජ.ඩොලර් මිලියන | රු. මිලියන |
| චී.සං.බැං | 152.80 | 16,976.00 | - | - | - | 152.46 | 18,744.75 |
| ශ්‍රී.ලං.ර | 17.00 | 1,888.00 | 5.00 | - | 2.16 | - | 2,503.10 |
| | 169.80 | 18,864.00 | 5.00 | - | 2.16 | 152.46 | 21,247.85 |

### 3.2 භෞතික ප්‍රගතිය

ලැබුණු තොරතුරුවලට අනුව, ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත් පැකේජ 06 යටතේ දකුණ, සබරගමුව, මධ්‍යම, උතුරු හා නැගෙනහිර පළාත්වල කි.මී.197.97 ක ප්‍රමුඛතා මාර්ග 07 ක් සහ දකුණු පළාතේ සිරිබෝපුර මංසන්ධියේ ගුවන් පාලම ඉදිකිරීමේ වැඩ 2016 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණි.

### 3.3 මූල්‍ය පාලනය සම්බන්ධ ගැටළු

ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුවන් හරහා ප්‍රසම්පාදනය කරන ලද රු.මිලියන 96.82 ක් වටිනා ගෘහභාණ්ඩ, කාර්යාල උපකරණ, රසායනාගාර උපකරණ සහ මිනින්දෝරු උපකරණ යනාදි වැනි වත්කම් සත්‍යාපනය කිරීමට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය පියවර ගෙන නොතිබුණි.

**3.4 ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම**

**-------------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කටයුතු නිම කර තිබුණද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය විසින් ව්‍යාපෘතියේ වත්කම් සහ වගකීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයට භාරදීම සම්බන්ධව ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයට උපදෙස් ලබාදීමට පියවර ගෙන නොතිබුණි.

**(ආ)** ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අවසන් කිරීමේ පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය කටයුතු කර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන්, රු.මිලියන 21.02 ක් වටිනා සිවිල් වැඩ සහ මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලද අත්තිකාරම් මුදල් 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ වත්කම් හා වගකීම් වශයෙන් අඛණ්ඩව පෙන්වා තිබුණි.